# අන්තර්ජාලය නැතිවත් ගැසට් බලන්න පුළුවන්

# "ඉන්ට්‍රානෙට්"

සිරිලාලන විජේසිංහ

අන්තර්ජාතික වශයෙන් ව්‍යාප්ත වන අන්තර්ජාලය Internet හමුවේ "අන්තරාවෘත ජාලය "Intranet ද වඩාත් වැදගත්කමකින් යුතුව ව්‍යාප්ත වන ජාල විශේෂයක් වෙයි.

ඉතාමත් සරලව හැඳින්වුවහොත් ආයතනයක් හෝ ආයතන කිහිපයක් අතර පමණක් ක්‍රියාත්මක වන පරිගණක ජාල විශේෂයක් ලෙස මෙම "අන්තරාවෘත ජාල"Intranetහැඳින්විය හැක.

අද දවසේ ජනප්‍රිය ලෙසින් හැඳින්වෙන අන්තර්ජාලයInternetඉතා විශාල භූමි ප්‍රදේශයක එනම් බොහෝ රටවල් අතර ක්‍රියාත්මක වන පරිගණක ජාල අනන්ත සංඛ්‍යාවක එකතුවක්network of networks ලෙසින් පැතිර පවත්නා යෝධ පරිගණක ජාලයක් බව අපි දනිමු.

අන්තර්ජාලයේ විශේෂත්වය වනුයේ ජාල සේවා සපයන්නකුInternet Service Providerකෙනෙකු හරහා ජාල සබඳතාවක් Internet connectionලබා ගන්නා ඕනෑම අයකුට අන්තර්ජාලයේ කවර හෝ ඉමකට පියමං කිරීමට හැකිවීමත්, ඒ කවර හෝ සුපිරි ජාල ගැබකින් Web serverඑකකින් තමන්ට රිසි අයුරින් තොරතුරු ලබා ගැනීමට හැකිවීමත් මෙන්ම අන්තර්ජාලය තුළට තොරතුරු මුදා හැරීමට ද හැකිවීමයි.

එනම් අන්තර්ජාලය තුළට මුදා හැරීමට හැකිවනසේ සකසන ලද තොරතුරු සහිත වෙබ් අඩවියක් පවත්වාගෙන යාමට ද කවර අයකුට හෝ හැකියාව ඇත.

ඒ අනුව කිසිදු සීමාවකින් තොරව අසීමාන්තික පරිගණක අවකාශයක තොරතුරු හුවමාරු කර ගැනීමේ හැකියාව අන්තර්ජාලයInternetසතුව පවතී.

එහෙත් "අන්තරාවෘත ජාලයක" Intranetතත්ත්වය එසේ නොවේ. තීරණය කරන ලද සීමාවක සීමිත පරිගණක සමූහයක් අතර පමණක් ඇති කරන ලද ජාලයක් "අන්තරාවෘත ජාලයක්" වන අතර තොරතුරු හුවමාරු කිරීම හා අදාළ පරිගණක සන්නිවේදන කටයුතු කළ හැක්කේ එම පරිගණක ඇසුරු කරන පිරිසට පමණී.

ආයතනයක් තුළ හෝ සමූහ ව්‍යාපාරයකට Group of

> සේවකයින්, අන්තර් දෙපාර්තමේන්තු, අන්තර් ආයතන තෝරා ගත් පාරිභෝගිකයින්, ව්‍යාපාරික සහකරුවන් අතර පමණක් තොරතුරු හුවමාරු කර ගැනීමට හැකිවන සේ සන්නිවේදන කටයුතු සීමා කිරීම මෙම අන්තරාවෘත ජාලයක විශේෂත්වයයි.

companiesඅයත් ආයතන කිහිපයක් අතර හෝ පැතිර පවත්නා පරිගණක ජාලයක් අපට උදාහරණයක් ලෙස සැලකිය හැක.

සේවකයින්, අන්තර් දෙපාර්තමේන්තු, අන්තර් ආයතන තෝරා ගත් පාරිභෝගිකයින්, ව්‍යාපාරික සහකරුවන් අතර පමණක් තොරතුරු හුවමාරු කර ගැනීමට හැකිවන සේ සන්නිවේදන කටයුතු සීමා කිරීම මෙම අන්තරාවෘත ජාලයක විශේෂත්වයයි.

මෙය බාහිර පරිගණක ලෝකයෙන් වෙන් වූ සීමිත ජාලයක් වන අතර මෙලෙසින් නිර්මාණය කරනු ලබන ජාල Internal Web ලෙසින් ද හඳුන්වනු ලබයි.

මෙම ජාලයන් තුළ කෙරෙන සියළු පරිගණක කථාබහ සහ ඇමතීම් proto cols අන්තර්ජාල තාක්ෂණයට අනුරූපව සහ එම සන්නිවේදන ක්‍රම Internet communication Technology භාවිත වන ලෙසින් නිර්මාණය කෙරේ.

අන්තර්ජාලයේ මෙන්ම, සුපිරි ජාල ගැබ් Web Serversදත්ත ගබඩා ගැබ් Database serversආදියෙන් සමන්විත වන්නාවූද, එමෙන්ම ආයතනයේ "පරිශ්‍රයික ජාලය" Local Area Networkසතු අනෙකුත් පහසුකම් ද අන්තර්ගත වන "අන්තරාවෘත ජාලය" තවත් ලෙසකට කියහොත 'mini internetඑකක් ලෙසින් ද හැඳින්විය හැක.

අන්තරාවෘත ජාලයක් භෞතික වශයෙන් කුඩා භූමි ප්‍රදේශයක පැතිරී යා යුතුයැයි කියා නියමයක් ද නැත.

අනුරාධපුරයේ සහ මාතර ඇති ආයතන දෙකක් අතර වුවද අන්තරාවෘත ජාලයක් Intranet එකක් ක්‍රියාත්මක විය හැක. පරිගණක සබඳතාවයන් දුරකථන මාර්ග dial up conections ඔස්සේ ගොඩ නංවා ගත හැකි වෙයි. එමෙන් ම සමූහ ව්‍යාපාරයකට අයත් ආයතන විශාල සංඛ්‍යාවක් අතර වුවද අන්තරාවෘත ජාලයක් පවත්වාගෙන යා හැකි ය.

භෞතිකව විශාල වපසරියක පැතිරීමේ හැකියාව ද ඇත්නම් අන්තරාවෘත ජාලයක් Intranet එකක් අන්තර්ජාලයෙන 'Internetඑකෙන් වෙන් කොට හඳුනා ගැනීමේ පදනම කුමක් ද?

තෝරාගත් පිරිසකට පමණක්, එනම් අදාළ ජාලයට අයත් සීමිත පරිගණක සංඛ්‍යාව අතර පමණක් කථාබහ සීමා කර ගැනීම අන්තරාවෘත ජාලයේ එකම පදනම වෙයි.

අන්තරාවෘත ජාලයක් තුළ මූලික තොරතුරු raw information විශ්ලේෂිත ස්වරූපයේ දත්තsynthesized format අන්වේක්ෂණය කළ හැකි දත්ත ගබඩාsearchable databases ආදිය පරිහරණය කළ හැකි වෙයි.

එමෙන්ම අන්තරාවෘත ජාලය අයිතිකරුවන්ගෙන් තිසි පරිදි අනුමැතිය ලබා ගන්නා ග්‍රාහකයන්ට එම අන්තරාවෘත ජාලයට,Intranetඑකට සම්බන්ධ වීමට සහ ඉන් තමනට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට ද පහසුකම් සැලසිය හැකි වෙයි.

උදා : රජයේ මුද්‍රණ ආයතනය මගින් පවත්වාගන යන අන්තරාවෘත ජාලය

Intranet of the Government Press

Intranet එකකින් තොරතුරු ලබා ගැනීම සඳහා අපට Internet conection එකක් අවශ්‍යම වන්නේ ද නැත.

එහිදී අවශ්‍ය වන්නේ

1. දුරකථන සබඳතාවක්
2. පරිගණක කථාබහට අවශ්‍ය වන මෝඩමයක්(Modem)
3. ජාල බ්‍රවුසර් පරිගණක වැඩසටහන Web browserපමණි.
4. මීට අමතරව එම Intranetඑකේ තොරතුරු අඩංගු වන විශේෂිත ස්වරූපයක් formatඑකක් වෙතොත් එම පරිගණක වැඩසටහන ද අවශ්‍ය වේ.

උදා: රජයේ මුද්‍රණ ආයතනයේ අන්තරාවෘත ජාලයේ Intranet අඩංගු ලිපි සකසා ඇත්තේ PDFනම් වූ ස්වරූපයෙනි. Adobe's Portable Document Format මේ ස්වරූපයේ වූ ලිපි පරිගණකය මත විවෘත කර ගැනීමට Adobe Acrobat Reader නම් වූ වැඩසටහන අපට අවශ්‍ය වෙයි. ❑